WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020**

# 33 - ඉතිහාසය

**ලකුණු දීමේ පටිපාටිය**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

### අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

### 33 - ඉතිහාසය

**I** පත්‍රය - ලකුණු **1 x 40** = ලකුණු **40**

---

**II** පත්‍රය -

**I** කොටස

ප්‍රශ්න අංක 1 (අනිවාර්ය ප්‍රශ්නයකි.)

| | | | |
|---|---|---|---|
| (අ) කොටස | - | ලකුණු | 18 |
| (ආ) කොටස | - | ලකුණු | 12 |

ලකුණු **30**

**II** කොටස

| | | | |
|---|---|---|---|
| ප්‍රශ්න අංක 2 | - | ලකුණු | 18 |
| ප්‍රශ්න අංක 3 | - | ලකුණු | 18 |
| ප්‍රශ්න අංක 4 | - | ලකුණු | 18 |
| ප්‍රශ්න අංක 5 | - | ලකුණු | 18 |
| ප්‍රශ්න අංක 6 | - | ලකුණු | 18 |
| ප්‍රශ්න අංක 7 | - | ලකුණු | 18 |

(ඕනෑම ප්‍රශ්න 4කට)
**4 x 18** = ලකුණු **72**

**III** කොටස

WWW.OLEVELAPI.COM

| | | | |
|---|---|---|---|
| ප්‍රශ්න අංක 8 | - | ලකුණු | 18 |
| ප්‍රශ්න අංක 9 | - | ලකුණු | 18 |

(ඕනෑම ප්‍රශ්න 1කට)
**1 x 18** = ලකුණු **18**

ලකුණු **120**

### අවසාන ලකුණු ගණනය කිරීම

* සමස්ත පිළිතුරු පත්‍රයේ අවසන් ලකුණ මණ්ඩලය තුළ දී ගණනය කිරීම සිදු නොකෙරේ.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

| | | | |
|---|---|---|---|
| (i) | ..................................................<br>..................................................<br>.................................................. | √ | △ 4/5 |
| (ii) | ..................................................<br>..................................................<br>.................................................. | √ | △ 3/5 |
| (iii) | ..................................................<br>..................................................<br>.................................................. | √ | △ 3/5 |
| (03) | එකතුව | → | □ 10/15 |

WWW.OLEVELAPI.COM

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
**V. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

WWW.OLEVELAPI.COM

***

**I පත්‍රය - ඉගෙනුම් පල**

- ඉතිහාසය 10 සහ 11 ශ්‍රේණිවලට අදාල විෂය නිර්දේශවල ඇතුලත් ඉගෙනුම් පල ආවරණය වන පරිදි ඓතිහාසික සිද්ධීන් හා සංකල්ප පිළිබඳ දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණ, සංස්ලේෂණ හැකියා පිරික්සීම

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**33 S I**

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
## கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
## General Certificate of Education (Ord. Level) Examination, 2020

ඉතිහාසය I
வரலாறு I
History I

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු **80** ක් හිමි වේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

**1.** මහාවංසයේ මුල් කොටස රචනා කරන ලද මහානාම හිමියන් වැඩ වාසය කළේ කුමන අධ්‍යාපන ආයතනයක ද?
(1) අනුරාධපුරයේ දික්සඳ සෙනෙවියා පිරිවෙන (2) පොළොන්නරුවේ ආලාහන පිරිවෙන
(3) දඹදෙණියේ මයුරපාද පිරිවෙන (4) කැරගල පද්මාවතී පිරිවෙන

**2.** ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳව තොරතුරු ඇතුළත් සෙල්ලිපි ලිවීම ආරම්භ කොට ඇත්තේ කුමන යුගයේ දී ද?
(1) ප්‍රාග් ඓතිහාසික (2) පූර්ව ඓතිහාසික (3) මුල් ඓතිහාසික (4) ඓතිහාසික

**3.** අනුරාධපුර යුගයේ මුල් කාලීන ශිලා ලිපිවල භාවිත කර ඇති අක්ෂර හඳුන්වන්නේ මින් කවර නමකින් ද?
(1) ඛරෝෂ්ඨී (2) නාගර (3) පල්ලව (4) බ්‍රාහ්මී

**4.** පැරණි රජවරුන් ජනතාව දැනුවත් කිරීම උදෙසා පනවන ලද විවිධ නීති ඇතුළත් සෙල්ලිපි කිහිපයක් **I** තීරුවේ ද ඒවායේ ඇතුළත් තොරතුරු **II** තීරුවේ ද සඳහන් වේ. **I** තීරුවේ අනුපිළිවෙළ අනුව **II** තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. වේවැල්කැටිය සෙල්ලිපිය | A - නැව්තොටකින් අය කළ තීරු බදු |
| 2. බදුලු ටැම්ලිපිය | B - වෙළෙඳපොළක කටයුතු සම්බන්ධ නීතිරීති |
| 3. ගොඩවාය සෙල්ලිපිය | C - ගම්වල අධිකරණ කටයුතු හා අපරාධ නීතිය පිළිබඳ තොරතුරු |
| | D - පරිසරය හා කෘෂිකාර්මික කටයුතුවලට අදාළ නීති |

(1) A B C (2) C B A (3) C D A (4) D C B

**5.** ලෙන් ලිපි හෙවත් කටාරම් ලිපිවල වැඩි වශයෙන් දැක්වෙනුයේ,
(1) රජවරුන් පිළිබඳ තොරතුරු ය. (2) රජයේ ආඥා පිළිබඳ තොරතුරු ය.
(3) ලෙන් පිදූ පුද්ගලයන් ගැන ය. (4) ආරෝග්‍යශාලා සඳහා ඉඩම් ප්‍රදාන ගැන ය.

**6.** විවිධ විදේශීය බලපෑම්වලට නතු වුව ද, ශ්‍රී ලංකාවට අනන්‍ය වූ සංස්කෘතියක් ගොඩනැගී ඇත්තේ මින් කවර හේතුවක් නිසා ද?
(1) ඉන්දියානු උපමහද්වීපයට සමීපව පිහිටීම
(2) විශේෂ භූ විෂමතාවයකින් යුක්ත දූපතක් වීම
(3) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම
(4) පෙර අපර දෙදිග වෙළෙඳ මාර්ගයේ වැදගත් මධ්‍යස්ථානයක් වීම

**7.** හෝමෝසාපියන් මානවයා විසින් ශ්‍රී ලංකාව මිනිස් වාසයක් බවට පත් කරන ලදැයි අනුමාන කරන්නේ අදින් වසර කොපමණ ගණනකට පෙර සිට ද?
(1) එක් ලක්ෂ විසිපත් දහසකට (2) අසූ දහසකට
(3) තිස්අට දහසකට (4) විසිඅට දහසකට

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**8.** අතීතයේ දී පෙරදිග රටවල, බහුතර කැමැත්තෙන් තෝරා පත්කරගත් පාලකයා හැඳින්වූයේ කුමන නමින් ද?
(1) මපුරුමුක (2) ග්‍රාමික (3) මහාසම්මත (4) චක්‍රවර්ති

**9.** වියළි කලාපයේ කුඩා ගම්වැව් කේන්ද්‍රකර ගනිමින් ජනාවාස ව්‍යාප්ත වූයේ කුමන යුගයේ දී ද?
(1) ප්‍රාග් ඓතිහාසික (2) පූර්ව ඓතිහාසික (3) මුල් ඓතිහාසික (4) ඓතිහාසික

**10.** මුල් ඓතිහාසික යුගයේ ගංගා නිම්නවලට පිටතින් ව්‍යාප්ත වූ ජනාවාසවල වැසියන් සිය යැපීම් ක්‍රමය ලෙස අනුගමනය කරන ලද්දේ,
(1) සත්ත්ව පාලනයයි. (2) හේන් ගොවිතැනයි.
(3) කුඹුරු ගොවිතැනයි. (4) වෙළෙඳාමයි.

**11.** පැරණි ශ්‍රී ලංකාවේ පරුමකවරුන් සතුව පැවති දේශපාලන බලය මධ්‍යගත පාලන ක්‍රමයක් බවට පත් කළ ප්‍රථම පාලකයා වූයේ,
(1) පණ්ඩුකාභය රජතුමා ය. (2) කාවන්තිස්ස රජතුමා ය.
(3) දුටුගැමුණු රජතුමා ය. (4) වසභ රජතුමා ය.

**12.** ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ විවිධ ශිල්පීන් හැඳින්වීම සඳහා භාවිත කරන ලද නම් **I** තීරුවේ ද ඔවුන් නියැලුණු ශිල්ප ක්ෂේත්‍ර **II** තීරුවේ ද දැක්වේ. **I** තීරුවේ අනුපිළිවෙළ අනුව **II** තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. කබර | A - රන් කර්මාන්තය |
| 2. චිතකර | B - යකඩ කර්මාන්තය |
| 3. තුලදර | C - ඇත්දත් කැටයම් කර්මාන්තය |
| 4. දටික | D - චිත්‍ර ශිල්පය |
| | E - මැටි කර්මාන්තය |

(1) A B C D (2) B C A E (3) B D A C (4) E D A C

**13.** පැරණි ශ්‍රී ලංකාවේ වරාය ආශ්‍රිතව ගොඩනැගුණු ජනාවාස හැඳින්වූයේ කුමන නමින් ද?
(1) පට්ඨානගාම (2) කේවට්ටගාම (3) මණිකාරගාම (4) කසිකාරගාම

**14.** ශ්‍රී ලංකාවෙන් නිර්මාණය වී දකුණු ආසියාවට පැතිරගිය බව සැලකෙන තාක්ෂණික නිර්මාණය කුමක් ද?
(1) බිසෝකොටුව (2) ස්ථූප (3) ජල උද්‍යාන (4) දැදිගම ඇත්පහන

**15.** නිශ්ශංකමල්ල රජතුමාගේ කාලයේ දී 'ගවුත කණු' සිටුවන ලද්දේ,
(1) පොහොය කර්මය සිදු කළ භූමි සීමාව දැක්වීමට ය.
(2) සඟ සතු කළ ඉඩම්වල සීමාවන් දැක්වීමට ය.
(3) මහාමාර්ගවල දුර දැක්වීමට ය.
(4) වැව් බැම්වල දිග දැක්වීමට ය.

**16.** සුවිශේෂී තාක්ෂණික කුසලතාවන්ගෙන් යුතු වූ, පැරණිතම වාරි නිර්මාණයක් ලෙස සංරක්ෂණය කර ඇත්තේ මින් කුමන සොරොව්ව ද?
(1) පදවිය (2) මාදුරුඔය (3) නාච්චදූව (4) මින්නේරිය

**17.** පහත A, B, C හා D යන ප්‍රකාශ අතුරෙන් වසභ රජතුමා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?
A – රාජ්‍ය අනුග්‍රහය යටතේ ප්‍රථම වැව කරවීම
B – චෝල ආධිපත්‍යයෙන් රට මුදාගැනීම
C – ලම්බකර්ණ වංශයේ ආරම්භක පාලකයා වීම
D – රටේ අභ්‍යන්තර පාලනය විධිමත් කර, බදු අය කිරීම ක්‍රමවත් කිරීම
(1) A හා B (2) A හා D (3) B හා C (4) C හා D

**18.** පහත දී ඇති ප්‍රකාශ අතුරෙන් පොළොන්නරු යුගය සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) බුදුදහමත්-සංස්කෘතියත් කෙරෙහි හින්දු බලපෑම් දැකිය හැකි ය.
(2) මාඝ ආක්‍රමණය නිසා පොළොන්නරු රාජධානිය බිඳ වැටිණි.
(3) මහාතිත්ථය පොළොන්නරු යුගයේ ප්‍රධාන වරාය වශයෙන් පැවතිණි.
(4) පාලන මධ්‍යස්ථානයක් ලෙස පළමුව පොළොන්නරුව තෝරාගත්තේ සොළීන් ය.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**19.** නිශ්ශංකමල්ල රජුගෙන් පසු පොළොන්නරු සිංහාසනය සඳහා කාලිංග සහ පාණ්ඩ්‍ය රාජවංශ අතර පැවති බල අරගලයේ දී පාණ්ඩ්‍ය වංශය නියෝජනය කළ කාන්තාව,

(1) සුගලා ය. (2) කළ්‍යාණවතී ය. (3) ලීලාවතී ය. (4) තිලෝකසුන්දරී ය.

**20.** ශ්‍රී ලංකාවේ පැවති පැරණි රාජධානි කිහිපයක නම් **I** තීරුවේ ද, එම රාජධානි හා සම්බන්ධ සිදුවීම් කිහිපයක් **II** තීරුවේ ද දැක්වේ. **I** තීරුවේ අනුපිළිවෙළ අනුව **II** තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. යාපහුව | A - අරාබි ජාතික ඉබන් බතුතා ශ්‍රී ලංකාවට පැමිණීම |
| 2. කුරුණෑගල | B - පිලිප් ද ඔලිවේරා යටතේ පෘතුගීසි හමුදා මෙහෙයුම |
| 3. ගම්පොළ | C - සිංහල ජාතක කථා පොත සම්පාදනය කිරීම |
| 4. යාපනය | D - ආර්ය චක්‍රවර්ති ශ්‍රී ලංකාව ආක්‍රමණය කර දළදාව පැහැරගෙන යාම |

(1) A D C B (2) B C D A (3) D B A C (4) D C A B

**21.** යාපනය රාජ්‍යය සම්බන්ධයෙන් **නොගැළපෙන** ප්‍රකාශය කුමක් ද?

(1) එහි පාලක පරපුර 'නායක්කර්' රජ වංශයයි.
(2) නල්ලූර් යාපන රාජ්‍යයේ අගනුවරයි.
(3) උඩරට රාජධානියේ මෙන් භෞතික පරිසරයක් එහි නොවීමයි.
(4) යාපන රාජධානිය බිහිවූයේ රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසුවයි.

**22.** ඉන්දියන් සාගර කලාපයේ බල අරගලයේ දී ප්‍රංශ හා ඉංග්‍රීසි ජාතීන්ට ශ්‍රී ලංකාව වැදගත් වූයේ මින් කුමන කරුණක් සඳහා ද?

(1) ත්‍රිකුණාමල වරාය ලබාගැනීම (2) තම ආගම ප්‍රචාරය කිරීම
(3) කුළු බඩු වැනි වෙළෙඳ ද්‍රව්‍ය ලබාගැනීම (4) වතු වගාවට යොදාගත හැකි ඉඩම් ලබාගැනීම

**23.** ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවලින් පෘතුගීසීන් නෙරපා හැරීමට කෝට්ටේ පාලකයින් අපොහොසත් වීමට තුඩුදුන් ප්‍රධානම හේතුව වූයේ,

(1) කෝට්ටේ පාලකයන් අතර පැවති අසමගිකම් ය.
(2) ඇතැම් සිංහල ප්‍රධානීන් පෘතුගීසීන්ට පක්ෂව කටයුතු කිරීම ය.
(3) කෝට්ටේ පාලකයින්ට ශක්තිමත් නාවුක බලයක් නොමැති වීම ය.
(4) මුහුදුබඩ පළාත්වල ජනතාව පෘතුගීසීන්ට සහාය දීම ය.

**24.** ක්‍රි.ව. 1815 උඩරට යටත් කර ගැනීම සඳහා බ්‍රිටන්රිග් ආණ්ඩුකාරවරයාට විවිධ උපක්‍රම මගින් තොරතුරු ලබාදුන් පුද්ගලයා වූයේ,

(1) මැක්ඩෝවල් ය. (2) රොබට් ඇන්ඩෘස් ය.
(3) මේජර් හුක් ය. (4) ජෝන් ඩොයිලි ය.

**25.** **I** තීරුවෙහි දැක්වෙන සංකල්ප අනුපිළිවෙළ අනුව **II** තීරුවේ දැක්වෙන තොරතුරු නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. සමාජවාදය | A - ධනෝපායන මාර්ගවලින් උපරිම ලාභ උපයාගැනීම |
| 2. ධනවාදය | B - සමාජය සතු ධන සම්පත් පිළිබඳ පොදු අයිතිය පිළිගැනීම |
| 3. රාජ්‍ය නිර්බාධවාදය | C - ආර්ථික කටයුතුවල දී රජයේ අවම මැදිහත් වීම |
| | D - යටත්විජිතවල සම්පත් මව්රටෙහි ප්‍රයෝජනයට යොදාගැනීම |

(1) A B C (2) B A C (3) B D A (4) D A B

**26.** යුරෝපයේ පුනරුද සමයේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වැදගත් ම වෙනස වන්නේ,

(1) වංශාධිපතිවරුන්ගේ බලය වර්ධනය වීමයි. (2) ප්‍රාදේශීය රාජ්‍ය වෙනුවට ජාතික රාජ්‍ය බිහිවීමයි.
(3) රජුගේ බලතල සීමා වීමයි. (4) යටත්විජිත පිහිටුවා ගැනීමයි.

**27.** ජෝන් වයික්ලිප්, ජොන් හස් , ඉරාස්මස් හා මාටින් ලූතර් යන පුද්ගලයන් වඩාත් ප්‍රසිද්ධියට පත්වූයේ පහත සඳහන් කුමන කරුණක් සම්බන්ධයෙන් ද?

(1) භාෂාව හා සාහිත්‍යයේ පුනර්ජීවනයට සිදු කළ සේවය
(2) රෝමානු කතෝලික සභාවේ ක්‍රියා කලාපය විවේචනය කිරීම
(3) චිත්‍ර කලාවේ දියුණුවට දැක්වූ දායකත්වය
(4) විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් කිරීම

**28.** මහනුවර රාජධානි සමයේ 'පරවේණිගම්' නමින් හඳුන්වන ලද්දේ,
(1) විහාරාරාම සඳහා පූජා කළ ඉඩම් ය.
(2) රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම් ය.
(3) ගම්වැසියන් පරම්පරාගතව භුක්ති විඳි ඉඩම් ය.
(4) රදළ ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම් ය.

**29.** 'ජනතා පරමාධිපත්‍යය' යන මූලධර්මයෙහි අර්ථය ඇතුළත් ප්‍රකාශය මින් කුමක් ද?
(1) මහජන ඡන්දයෙන් පාලකයන් පත් කිරීමට හා ඉවත් කිරීමට ඇති අයිතිය
(2) මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීමක දී සහනයක් ලබාගැනීමේ අයිතිය
(3) තමන් කැමති දේශපාලන අදහස් අනුව කටයුතු කිරීමේ නිදහස
(4) මාධ්‍ය මගින් රජය විවේචනය කිරීමේ අයිතිය

● පහත A සිට E දක්වා ඇති තොරතුරු ඇසුරෙන් **30** සහ **31** යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම
B – ද්විමණ්ඩල පාර්ලිමේන්තුව
C – බ්‍රිතාන්‍යයේ රජු/රැජින ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකත්වයෙන් ඉවත් වීම
D – පූර්ණ විධායක බලය සහිත ජනාධිපති ධුරය
E – ඔම්බුඩ්ස්මන් තනතුර ස්ථාපිත කිරීම

**30.** 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය හා 1972 ජනරජ ආණ්ඩුක්‍රමය හා සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

**31.** 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

● පහත වගුවේ **A** සිට **F** දක්වා දී ඇති තොරතුරු ඇසුරෙන් **32** ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

| රට | සිදුවීම | ප්‍රතිඵලය |
|---|---|---|
| A. ජපානය | C. ලුසිටානියා නැව ගිල්වීම | E. ජාතීන්ගේ සංගමය බිහිවීම |
| B. ජර්මනිය | D. පර්ල් වරායට පහරදීම | F. පරමාණු බෝම්බ හෙළීම |

**32.** පළමුවන ලෝක මහා සංග්‍රාමයට අදාළ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A C E (2) A C F (3) B C E (4) B D F

**33.** දෙවන ලෝක මහා සංග්‍රාමය අවසන් කිරීමට බලපෑ තීරණාත්මක සිදුවීම මින් කුමක් ද?
(1) ඉතාලි රාජ්‍ය නායකයා ඝාතනයට ලක්වීම
(2) ඇමෙරිකා එක්සත් ජනපදය මිත්‍ර පිලට එකතු වීම
(3) ජර්මන් ගුවන් හමුදාව බ්‍රිතාන්‍ය අතින් පරාජයට පත්වීම
(4) ජපානයේ හිරෝෂිමා හා නාගසාකි නගරවලට පරමාණු බෝම්බ ප්‍රහාරයක් එල්ල වීම

**34.** එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සකස් කිරීම සඳහා පදනම් වූයේ,
(1) ටෙහෙරාන් සමුළුව ය. (2) අත්ලන්තික් සමුළුව ය.
(3) මොස්කව් සමුළුව ය. (4) සැන් ප්‍රැන්සිස්කෝ සමුළුව ය.

● පහත දැක්වෙන A හා B ප්‍රකාශ ඇසුරෙන් **35** ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A – "නියෝජිතයන් නැතිනම් බදුත් නැත."
B – "මේ අවස්ථාවේ අපි බලය අල්ලා නොගතහොත් ඉතිහාසය අපට සමාව නොදෙනු ඇත."

**35.** ඇමෙරිකානු නිදහස් සටන සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

**36.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් රුසියානු විප්ලවය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) විප්ලවය ආරම්භක අවධියේ ගොවිජනතාව විවිධ දුෂ්කරතාවලට මුහුණ දී සිටියහ.
(2) සමාජවාදී දර්ශනය ලොවපුරා ව්‍යාප්තවීම රුසියානු විප්ලවයේ ප්‍රතිඵලයකි.
(3) ජනතාවගෙන් අධික ලෙස බදු අය කළ සාර් පාලනය ඉතා දූෂිත විය.
(4) එකල රුසියාවේ ධනවාදී ආර්ථික ක්‍රමයක් පැවතිණි.

● පහත A, B, C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. ඒ එක් එක් ප්‍රකාශ යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර **37** සිට **39** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. නිරවි යුද්ධය
2. රහස් ඔත්තු සේවා

B – 1. නොබැඳි ජාතීන්ගේ සමුළුව
2. වින්ස්ටන් චර්චිල්

C – 1. යුදෙව් ජාතිකයන්
2. නට්සි හමුදාව

D – 1. ප්‍රංශ හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය
2. දෙවන ලෝක සංග්‍රාමය

**37.** පළමුවැන්නේ ක්‍රියාකාරිත්වය තීව්‍ර කිරීමට දෙවැන්නේ බලපෑම දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**38.** පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධයක් **නොදක්වන** යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**39.** පළමුවැන්නේ බිඳ වැටීම කෙරෙහි දෙවැන්නේ බලපෑම දැක්වෙන යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**40.** සුවස් ඇළ ජනසතු කිරීම හා නොබැඳි ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමට සහාය වීම නිසා ලෝක අවධානයට ලක් වූ ජන නායකයා,
(1) අබ්දුල් ගමල් නසාර් ය. (2) මහතීර් මොහොමඩ් ය.
(3) ජවහල්ලාල් නේරු ය. (4) මාෂල් ටිටෝ ය.

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
# க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2020
## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

විෂය අංකය / பாட இலக்கம்: 33 විෂයය / பாடம்: ඉතිහාසය

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 3 | 21. | 1 | 31. | 4 |
| 02. | 3 | 12. | 3 | 22. | 1 | 32. | 3 |
| 03. | 4 | 13. | 1 | 23. | 3 | 33. | 4 |
| 04. | 2 | 14. | 1 | 24. | 4 | 34. | 4 |
| 05. | 3 | 15. | 3 | 25. | 2 | 35. | 3 |
| 06. | 2 | 16. | 2 | 26. | 2 | 36. | 4 |
| 07. | 1 | 17. | 4 | 27. | 2 | 37. | 1 |
| 08. | All | 18. | 3 | 28. | 3 | 38. | 2 |
| 09. | 3 | 19. | 3 | 29. | 1 | 39. | 4 |
| 10. | 2 | 20. | 4 | 30. | 2 | 40. | 1 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

# II පත්‍රය

## I කොටස

**(අ)** (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

මාදුරු ඔය, සෙංකඩගල, නල්ලූර්, ලංකා පටුන, මිහින්තලේ, කුරුණෑගල, කාවරගාම, ඉරණමඩු වැව, කොත්මලේ ජලාශය, මන්නාරම දූපත, කැළණිය, හෝර්ටන්තැන්න (ලකුණු 12 යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

ජාවා දූපත, මධ්‍යධරණී මුහුද, ගෝව, කොරියානු අර්ධද්වීපය, මදුරාසිය, වැනීසිය (ලකුණු 06 යි)

**(ආ)** (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - දේශ ගවේෂණ කටයුතුවලට අනුග්‍රහය දැක්වූ පෘතුගාලයේ රාජකීය පුද්ගලයා නම් කරන්න.

*B* - දෙවන ලෝක මහා යුද්ධය අවසන් කිරීමේ ගිවිසුමට අත්සන් කළ ජපාන අධිරාජයා නම් කරන්න.

*C* - පළමුවන විජයබාහු රජතුමා පිළිබඳ තොරතුරු ලැබෙන තඹ සන්නස කුමක් ද?

*D* - ශ්‍රී ලංකාවේ 'නිදහස් අධ්‍යාපනයේ පියා' වශයෙන් ගෞරවයට පාත්‍ර වූ ඇමතිවරයා නම් කරන්න. (ලකුණු 04 යි)

● *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන චිත්‍රය සිතුවම් කොට ඇත්තේ කොහේ ද?

2. එය කරවූවා යැයි සැලකෙන රජතුමා නම් කරන්න.

3. රූපයේ දැක්වෙන කාන්තාවන් පැළඳ සිටින ආභරණ අතුරෙන් **එකක්** සඳහන් කරන්න.

4. මෙම චිත්‍රය නැරඹූ අය තම අදහස් සටහන් කොට ඇති නිර්මාණය නම් කරන්න. (ලකුණු 04 යි)



*A*

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?

2. දෙවන ලෝක මහා යුද සමයේ මොහු කුමන රටක රාජ්‍ය නායකයා වී ද?

3. මොහුගේ දේශපාලන දර්ශනය හඳුන්වනු ලැබූයේ කුමන නමකින් ද?

4. මොහු විසින් යුද බලයෙන් යටත් කරගත් අප්‍රිකානු රට නම් කරන්න. (ලකුණු 04 යි)



*B*

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


33 STE II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020


ඉතිහාසය II
வரலாறு II
History II

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)

විභාග අංකය / சுட்டெண் / Index No. ............................



1. (අ) (ii)
1. (அ) (ii)
1. (a) (ii)



### I කොටස

**(ආ)**

(i) ලංකා සිතියම ස්ථාන 12ක් ලකුණු කොට නම් කිරීම

***(ලකුණු 12 යි.)***

(ii) ලෝක සිතියම ස්ථාන 06ක් ලකුණු කොට නම් කිරීම

***(ලකුණු 06 යි.)***

**(ආ)**

(i) A - නාවික හෙන්රි / හෙන්රි කුමාරයා / පෘතුගාලයේ හෙන්රි කුමාරයා

B - හිරෝහිතෝ

C - පනාකඩුව තඹ සන්නස

D - සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මැතිතුමා

***(ලකුණු 04 යි.)***

(ii)

1 - සීගිරිය

2 - පළමුවන කාශ්‍යප / සීගිරි කාශ්‍යප

3 - වළලු, මාල, කර්ණාභරණ, ශීර්ෂ පළඳනා

4 - කැටපත් පවුර

***(ලකුණු 04 යි.)***

(iii)

1 - බොනිටෝ මුසෝලිනී /මුසෝලිනී

2 - ඉතාලිය

3 - ෆැසිස්ට්වාදය / ෆැසිස්ට්

4 - ඇබිසීනියාව (ඉතියෝපියාව)

***(ලකුණු 04 යි.)***

WWW.OLEVELAPI.COM

## II කොටස

### 2. ඉගෙනුම් පල

- මූලාශ්‍රය වර්ග කරයි
- මූලාශ්‍රය ඇසුරින් ඉතිහාසය විස්තර කරයි
- ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම පහදයි
- ජන ජීවිතය සාර්ථක කර ගැනීමට ඉතිහාසයෙන් ලබා ගත හැකි ආදර්ශ පෙන්වා දෙයි

2. (i) අතීතයේ දී ශ්‍රී ලංකාවේ කාසි නිර්මාණය සඳහා යොදාගත් ලෝහ වර්ග **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) පුරාවිද්‍යාත්මක කැනීම්වලින් මෙරටින් හමු වූ විදේශ කාසි අයත් වූ රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(iii) විදේශ වෙළෙඳ සම්බන්ධතා පැවැත්වීමට යොදාගත් ශ්‍රී ලංකාවේ පැරණි වරායන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(iv) ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රයක් වශයෙන් කාසි වැදගත් වන ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)
(v) පුරාවස්තු රැකගැනීමේ වැදගත්කම කරුණු **තුනක්** යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

I. රන්, රිදී, තඹ

***(ලකුණු 01 x 3 = 03 යි.)***

II. ඉන්දියාව
චීනය
රෝමය (මින් දෙකක්)

***(ලකුණු 1 X 2 =02 යි.)***

III. මහාතිත්ථ
ගෝකණ්ණ
ජම්බුකෝලපට්ටන
ගොඩවාය...... (මින් දෙකක්)

***(ලකුණු 1 X 2 =02 යි.)***

IV.

- රටක ආර්ථික තත්ත්වය පිළිබඳ අවබෝධය ලබා ගැනීමට
- ඇතැම් රජවරුන් හා ඔවුන්ගේ රාජ්‍ය පාලන කාලය හඳුනා ගැනීමට
- රජවරුන්ගේ රාජ්‍ය පාලන ප්‍රදේශ හා කාලය පිළිබඳව හඳුනා ගැනීමට
- විදේශ වෙළෙඳාම පිළිබඳ දැන ගැනීමට
- ලෝහ තාක්ෂණය පිළිබඳ අවබෝධය

***(ලකුණු 2+ 3 = 05 යි.)***

WWW.OLEVELAPI.COM

V.

- අතීත උරුමය අනාගත පරපුරට පවරා දීම
- රටේ අනන්‍යතාව වටහා ගැනීම
- අතීතයේ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, ආගමික තත්ත්වය පිළිබඳ තොරතුරු අවබෝධ කර ගැනීම
- තම රට පිළිබඳ අභිමානයක් ඇති කර ගැනීම
- සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් තොරතුරු සනාථ කර ගැනීමට

***(ලකුණු 3 +3 = 06 යි.)***

03. **ඉගෙනුම් පල**

- ප්‍රාග් හා පූර්ව ඓතිහාසික යුග විස්තර කරයි
- ප්‍රාග් ඓතිහාසික යුගවල මානව ජනාවාස පිහිටි ස්ථාන හඳුනා ගනියි
- ප්‍රාග් හා පූර්ව ඓතිහාසික යුගවල ජීවන රටාව හා තාක්ෂණය විස්තර කරයි
- ශ්‍රී ලංකාවේ මුල් යුගයේ පාලකයන් පිළිබඳ තොරතුරු විස්තර කරයි

**3.** (i) මෙරට අධික වර්ෂාපතනයක් පැවති භූ අවධිය කුමක් ද? (ලකුණු 01 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයන් පිළිබඳ තොරතුරු ලැබෙන හම්බන්තොට දිස්ත්‍රික්කයේ ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) (a) ප්‍රාග් ඓතිහාසික මානවයන් ආහාර සපයාගත් ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(b) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා ආහාරයට ගත් ශාකමය ආහාර වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා භාවිත කළ තාක්ෂණික දැනුම, උඩරංචාමඩම ආශ්‍රිත කැනීම්වලින් අනාවරණය කරගත් තොරතුරු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(v) වසභ රජතුමාගේ පාලන කාලයේ දී මහ වැව් ඉදිකිරීම ආරම්භ වීමට පසුබිම් වූ හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

I. ප්ලයිස්ටොසීන භූ යුගය

***(ලකුණු 01 යි.)***

II. බුන්දල / වැල්ලෙගංගොඩ
පතිරාජවෙල
මිනිහාගල්කන්ද
උඩමළල
අලුගල්ගේ (මින් දෙකක්)

III. (a) දඩයම
ආහාර එක්රැස් කිරීම

***(ලකුණු 1 X 02 =02 යි.)***

(b) වල් දෙල්, කැලෑ කෙසෙල්, ගෝනල, කටු අල, කිතුල් ඇට මද.........

***(ලකුණු 02 යි.)***

IV.

- පොළොවට ලම්බාකාර වන ලෙස බිත්ති බැඳීම.
- ගල් පතුරු යොදා ශක්තිමත්ව ගිලා නොබසින සේ ගෙබිම හා අත්තිවාරම සැකසීම.
- සකපෝරුව භාවිතා කොට මැටි බඳුන් නිෂ්පාදනය
- මැටි බඳුන් වර්ණ ගැන්වීම
- ලෝහ තාක්ෂණය පිළිබඳ දැනුම හා භාවිතය
- මැටි පබළු නිපදවීම

***(ලකුණු 02 + 03 = 05 යි.)***

V.

- වැඩිවන ජනගහනයට සාපේක්ෂව ආහාර නිෂ්පාදනය වැඩි කළ යුතු වීම
- වර්ෂාපතනය ප්‍රමාණවත් නොවීම
- වර්ෂාපතනය ලැබීමේ අවිනිශ්චිත බව
- විදේශ රටවල ඉල්ලුමට සරිලන පරිදි වී නිෂ්පාදනය වැඩි කිරීම
  (ඉන්දියාවේ ක්‍රිෂ්ණ ගංගා නදී නිම්නය)

***(ලකුණු 03 + 03 = 06 යි.)***

04. **ඉගෙනුම් පල**

- අනුරාධපුර යුගයේ වැව් ඉදිකිරීමට යොදාගත් ගංගා නම් කරයි
- ඓතිහාසික යුගයට අයත් ජල කළමනාකරණය හා වාස්තු විද්‍යාත්මක දැනුම විස්තර කරයි
- දෙවන නාගරීකරණ සමයේ ආර්ථික කටයුතු විස්තර කරයි

WWW.OLEVELAPI.COM

4. (i) අනුරාධපුර යුගයේ දී මහා වාරිමාර්ග පද්ධති නිර්මාණය කිරීම සඳහා යොදාගත් ගංගාධාර **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත A සිට D දක්වා ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුරු වරහන තුළින් තෝරා **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

A - අභයගිරි විහාරයට අයත්, කලාව හා තාක්ෂණය අතින් විශිෂ්ට ගණයේ නිර්මාණයක් වන පොකුණ

B - මින්නේරිය සහ කවුඩුල්ල යන වැව්වලට ජලය ගෙන යන ඇළ මාර්ගය

C - වැවක රොන්මඩ ඉවත් කිරීමට හැකි වන පරිදි වැව් බැම්මේ පහළ මට්ටමක ඉදිකර ඇති විවරය

D - භික්ෂූන් වහන්සේලාගේ පොහොය කර්මය සඳහා ඉදිකොට ඇති මහා විහාරයට අයත් මහල් කිහිපයකින් යුත් ගොඩනැගිල්ල

(ලෝවා මහා ප්‍රාසාදය, සත්මහල් ප්‍රාසාදය, රළපනාව, මඩ සොරොව්ව, ඇළහැර ඇළ, අඟමැඩිල්ල ඇළ, ඇත් පොකුණ, කුට්ටම් පොකුණ) (ලකුණු 04 යි)

(iii) කුඩා ගම් වැව් පද්ධති (එල්ලංගාව) වියළි කලාපයේ ඉදිකිරීමෙන් සපුරාගැනීමට බලාපොරොත්තු වූ අරමුණු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන නාගරීකරණ යුගයේ දී විශාල වාරිමාර්ග පද්ධති බිහි **නොවීමට** බලපෑ සාධක **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

I. මහවැලි ගඟ

මල්වතු ඔය

කලා ඔය

යාන් ඔය

මාදුරු ඔය

මෝදරගම් ආරු

මහ ඔය (මින් තුනක්)

***(ලකුණු 1 X 3 = 3 යි)***

II.

A - කුට්ටම් පොකුණ

B - ඇළහැර ඇළ

WWW.OLEVELAPI.COM

C - මඩ සොරොව්ව

D - ලෝවාමහා ප්‍රාසාදය

***(ලකුණු 1 X 4 =4 යි)***

III.

- ජලය ගබඩා කොට කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීම
- ජලයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම
- භූගත ජල මට්ටම ආරක්ෂා කර ගැනීම
- වැව් පද්ධතියට සම්බන්ධ ඇළ මාර්ග අවට ප්‍රදේශයේ තෙතමනය රැක ගැනීම

***(ලකුණු 2 + 3 =5 යි)***

IV.

- රාජ්‍ය අනුග්‍රහය ප්‍රමාණවත්ව නොලැබීම
- රාජ්‍යයේ ආරක්ෂාව සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවීම
- විශාල වාරි පද්ධති ඉදිකිරීමට සුදුසු භෞතික පරිසරයක් නොතිබීම
- දෙවන නාගරීකරණ යුගයේ තෙත් කලාපීය ප්‍රදේශවලට ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබීම නිසා වාරි පද්ධති ඉදි කිරිමේ අවශ්‍යතාවක් ඇති නොවීම
- ආහාර ද්‍රව්‍ය සුලබ වීම
- විදේශ වෙළෙඳ කටයුතුවලට වැඩි අවධානයක් යොමු කිරීම

***(ලකුණු 3+ 3 =6 යි)***

## 05. **ඉගෙනුම් පල**

- කෝට්ටේ රාජධානියේ දේශපාලනික තොරතුරු පිළිබඳ විස්තර කරයි
- මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානය, ආර්ථික ක්‍රමය හා සමාජ සංවිධානය විස්තර කරයි
- මහනුවර රාජධානියේ රජවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය පැහැදිලි කරයි

5. (i) විජයබා කොල්ලය හා සම්බන්ධ වූ කුමාරවරුන් **තිදෙනා** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) උඩරට රාජ්‍ය සම්බන්ධයෙන් පහත *A*, *B*, *C* හා *D* යටතේ ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

*A* - දේශපාලන වශයෙන් රජුට පමණක් දෙවෙනි වූ මහවාසල නිලධාරියා

*B* - දන්ත ධාතූන් වහන්සේගේ හා දළදා මාලිගාවේ කටයුතු භාර වූ පුද්ගලයා

*C* - පළමු සංඝරාජ මාහිමියන් වහන්සේ

*D* - උඩරට රාජ්‍යය සතු වූ වර්තමාන උතුරුමැද පළාතට ප්‍රමාණයෙන් සමාන වන ප්‍රදේශය

(නුවරකලාවිය, තමන්කඩුව, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, වැලිවිට ශ්‍රී සරණංකර හිමි, බස්නායක නිලමේ, දියවඩන නිලමේ, අධිකාරම්, මහ දිසාව) (ලකුණු 04 යි)

(iii) උඩරට රාජ්‍යයේ කෘෂිකාර්මික කටයුතු සංවිධානය වී තිබූ ආකාරය කරුණු **දෙකක්** යටතේ විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පළමුවන විමලධර්මසූරිය රජතුමා මහනුවර රාජ්‍යයේ සිටි ශ්‍රේෂ්ඨ පාලකයෙකු බව සාධක **තුනක්** ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) බුවනෙකබාහු
රයිගම්බණ්ඩාර
මායාදුන්නේ

***(ලකුණු 01 x 3 = 03 යි.)***

(ii)

A - අධිකාරම්

B - දියවඩන නිලමේ

C - වැලිවිට ශ්‍රී සරණංකර හිමි

D - නුවරකලාවිය

***(ලකුණු 01 x 04 = 04 යි.)***

(iii)

- වී ගොවිතැන - හෙල්මළු ක්‍රමයට
- හේන් ගොවිතැන - කඳු බෑවුම්වල
  උඳු, මුං, තල, මෑ, අල, බතල........
- ගෙවතු වගාව - කොස්, පොල්, පුවක්, බුලත්, කුළු බඩු වර්ග............
- සත්ත්ව පාලනය - ගවයන්, එළුවන්, කුකුළන්, (කිරි ලබා ගැනීම, කෘෂි කටයුතු)

***(ලකුණු 02 + 03 = 05 යි.)***

(iv)

**දේශපාලනය**

- උඩරට රාජ්‍යය පෘතුගීසි ආක්‍රමණවලින් ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම
- සීතාවක රාජධානියෙන් එල්ල වූ බලපෑම පරාජයට පත් කිරීම

**ආර්ථික**

- ගොවිතැන දියුණු කිරීම
- කපු වගාව දියුණු කිරීම
- කොත්මලේ හා වලපනේ ප්‍රදේශයේ යකඩ හා වානේ කර්මාන්තය දියුණු කිරීමට කටයුතු කිරීම
- වෙඩි ලුණු කර්මාන්තය දියුණු කිරීම

WWW.OLEVELAPI.COM

**ආගමික**

- දෙල්ගමුවේ සඟවා තිබූ දන්ත ධාතූන් වහන්සේ මහනුවරට වැඩම කරවීම
- බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒම
- වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය (ලංකාතිලකය, රිදී විහාරය, ගඩලාදෙනිය)

***(ලකුණු 03 + 03 = 06 යි.)***

## 06. ඉගෙනුම් පල

- ලන්දේසීන් යටතේ ශ්‍රී ලංකාවේ වතු වගාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ වතු වගාව පිළිබඳ විස්තර කරයි

- නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියා මාර්ග විස්තර කරයි

6. (i) ලන්දේසීන් විසින් ප්‍රථමවරට මෙරට වතුවගාවක් ලෙස ආරම්භ කළ බෝගය කුමක් ද? (ලකුණු 01 යි)
(ii) බ්‍රිතාන්‍යයන් විසින් උඩරට ආරම්භ කරන ලද එහෙත් පසුව අසාර්ථක වූ බෝග වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(iii) (a) වතුවගාව ආරම්භ කිරීමේ දී ව්‍යාපාරිකයන්ට මුහුණදීමට සිදු වූ ප්‍රධාන අභියෝග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(b) එම අභියෝග විසඳාගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග **දෙක** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(iv) මෙරට ගොවිජනපද ආරම්භ කිරීම සඳහා වියළි කලාපය තෝරාගැනීමේ දී විශේෂත්වයක් ලැබීමට බලපෑ සාධක **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
(v) මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ අරමුණු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) කුරුඳු

***(ලකුණු 01 යි.)***

(ii) කෝපි, සිංකෝනා, කොකෝවා

***(ලකුණු 02 යි.)***

(iii)

a) වතු වගාවට අවශ්‍ය ඉඩම් ලබා ගැනීම
ශ්‍රමිකයන් සපයා ගැනීම

***(ලකුණු 02 යි.)***

b)

- රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය
- වැටුපට ශ්‍රමිකයන් බඳවා ගැනීමේ අරමුණින් රාජකාරී ශ්‍රම ක්‍රමය අහෝසි කිරීම සහ දකුණු ඉන්දීය ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම

***(ලකුණු 02යි.)***

(iv)

- වගාවට සුදුසු සාරවත් පසකින් යුක්ත වීම
- ජනහීන තැනිතලා බිම් බහුල වීම
- වියළි කලාපයේ පැරණි වැව් හා වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කොට එහි ඉඩම් ආර්ථික සංවර්ධනයට යොදා ගැනීමට හැකි වීම
- නව වාරිමාර්ග ඇරඹීමට සුදුසු භූ විෂමතාවකින් යුතුවීම

***(ලකුණු 02 + 03 = 05 යි.)***

(V)

- වියළි කලාපයේ ගොවි බිම් සඳහා නිත්‍ය ජල පහසුකම් සැපයීම
- විදුලිබල උත්පාදනය වැඩි කිරීම
- ආහාර භෝග වගාව ව්‍යාප්ත කිරීම
- ගං වතුර පාලනය
- මිරිදිය මසුන් බෝ කිරීම
- රැකියා අවස්ථා සුලභ කිරීම

*(කරුණු තුනක් විස්තර කිරීම)*

*(ලකුණු 03 + 03 = 06 යි.)*

07. **ඉගෙනුම් පල**

- බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගත් ආකාරය විස්තර කරයි
- බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශනය පිළිබඳ විස්තර කරයි
- 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි

7. (i) පහත A, B සහ C හි දැක්වෙන අවස්ථාවලට සම්බන්ධ පුද්ගලයන් **අනුපිළිවෙළින්** නම් කරන්න.
   A - ශ්‍රී ලංකාවේ මුල්ම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා
   B - වර්ෂ 1818 උඩරට නිදහස් සටන පැවති අවධියේ මෙරට ආණ්ඩුකාරවරයා
   C - වර්ෂ 1848 නිදහස් සටන පැවති අවධියේ මෙරට ආණ්ඩුකාරවරයා (ලකුණු 03 යි)
(ii) (a) යටත්විජිත භාර මහලේකම්වරයා විසින් කෝල්බෲක් කොමිසම මෙරටට එවීමට පාදක වූ හේතුවක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (b) ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීම පිණිස කෝල්බෲක් කොමිසම ඉදිරිපත් කළ යෝජනාව කුමක් ද? (ලකුණු 02 යි)
(iii) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් ශ්‍රී ලාංකික පුරවැසියන්ට ලැබුණු ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය සඳහන් කොට, එමගින් ශ්‍රී ලාංකිකයන්ට අත්වුණු වාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට අදාළ පහත දී ඇති මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   A - ජනාධිපතිවරණය
   B - සමානුපාතික නියෝජන ක්‍රමය
   C - ජනමත විචාරණය (ලකුණු 06 යි)

(i)
A - ෆෙඩ්රික් නෝර්ත්
B - රොබට් බ්‍රවුන්රිග්
C - ටොරින්ටන් සාමි

*(ලකුණු 01 x 03 = 03 යි.)*

(ii)
a) - රජයේ ආදායමට වඩා වියදම වැඩිවීම පිළිබඳ සොයා බලා වාර්තා කිරීම
   - අධිකරණ හා නීතිමය තත්ත්වය පිළිබඳ පරීක්‍ෂා කොට නිර්දේශ ඉදිරිපත් කිරීම

b) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම

*(ලකුණු 02 x 02 = 04 යි.)*

(iii) • සර්වජන ඡන්ද බලය

1. ඡන්ද බලය මගින් මහජන නියෝජිතයන් තෝරාපත් කර ගැනීමට හැකිවීම
2. මහජන අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා වැඩි අවස්ථා ලැබීම
   සෞඛ්‍ය, කෘෂිකර්ම, අධ්‍යාපන, ගමනාගමන

*(අවම වශයෙන් කරුණු දෙකක් සඳහා)*

*(ලකුණු 01 + 02 +02 = 05 යි.)*

(iv) **A. ජනාධිපතිවරණය**

- සමස්ත රටම ඡන්ද කොට්ඨාශයක් සේ සලකා ඡන්දය පැවැත්වීම
- ජනාධිපතිවරයා පත්කර ගැනීමේ දී ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් 50% ක් ඉක්ම වූ ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත යුතුය
- ජනාධිපති ධූර කාලය වසර 6කි
- ධූර කාලයෙන් වසර හතරක් ගත වූ පසු දෙවන වරමක් ඉල්ලා ජනාධිපතිවරණයට යොමු විය හැකිය

**B. සමානුපාතික නියෝජන ක්‍රමය**

- ශ්‍රී ලාංකිකයන්ට නව ක්‍රමයකි
- පාර්ලිමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන සඳහා නියෝජිතයන් තෝරාපත් කර ගැනීමට මෙම ක්‍රමය භාවිතා කරයි
- මෙම ක්‍රමය යටතේ අපේක්ෂකයන් කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් වෙයි
- පක්ෂයට ඡන්දය සලකුණු කොට අපේක්ෂකයාට මනාප සටහන් කළ යුතු ක්‍රමයකි
- එකිනෙක පක්ෂ ලබා ගත් ඡන්ද සංඛ්‍යාවට අනුපාතිකව පක්ෂයට හිමි ආසන ගණන තීරණය වේ

**C. ජනමත විචාරණය**

- ජාතික වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධව සෘජුවම මහජන මතය ලබා ගන්නා ක්‍රමයකි
- ඡන්ද දායකයාගේ අභිමතය ඔව් / නැත ලෙස ප්‍රකාශ කරයි
- 1982 දී ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ජනමත විචාරණයක් පවත්වා ලදි
- සමස්ත දිවයින ම එක ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකනු ලබයි
- ඉදිරිපත් කරනු ලබන කරුණ සම්මත වන්නේ වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 50% කට වැඩි ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමෙනි

WWW.OLEVELAPI.COM

*(එක් මාතෘකාවක් සම්බන්ධව අවම වශයෙන් කරුණු 02ක්වත් ඇතුළත් විය යුතුය)*

***(ලකුණු 03 X 2 = 06 යි.)***

## III කොටස

**08. ඉගෙනුම් පල**

- පුනරුදයේ ආරම්භය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- පුනරුදය විවිධ ක්ෂේත්‍රවලට බලපෑ ආකාරය විස්තර කරයි
- පුනරුදයේ ගෝලීය බලපෑම පැහැදිලි කරයි

**8.** (i) ක්‍රි.ව. 1453 දී තුර්කීන් අත්පත් කරගත්, ග්‍රීක-රෝම උගතුන් අධ්‍යයන කටයුතුවල නිරත වූ නගරය කුමක් ද? (ලකුණු 01 යි)

(ii) වෙළෙඳ හා වාණිජ කටයුතු නිසා ප්‍රසිද්ධියට පත් ඉතාලියේ නගර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) (a) පුනරුද සමයේ ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(b) පුනරුද සමයේ විශ්වය පිළිබඳ ඉදිරිපත් වූ නව මත **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iv) පුනරුද සමයේ ඉතාලියේ බිහිවූ චිත්‍ර හා මූර්ති කලාවේ විශේෂ ලක්ෂණ **දෙකක්** නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(v) දේශ ගවේෂණ නිසා ලෝකයේ ඇති වූ දේශපාලන වෙනස්කම් සහ ආර්ථික වෙනස්කම් **එක** බැගින් දක්වා ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) කොන්ස්තන්තිනෝපලය

***(ලකුණු 01 යි.)***

(ii) වැනීසිය, ජිනෝවා, රෝමය

***(ලකුණු 02 යි.)***

(iii) a)

- අර්ධ ගෝලාකාර ශිඛර
- වටකුරු ආරුක්කු
- උස් කුලුනු

***(ලකුණු 02 යි.)***

b) - පෘථිවිය ගෝලාකාර බව
- සූර්යා වටා ග්‍රහයින් ඉලිප්සාකාරව පරිභ්‍රමණය වන බව
- ගුරුත්වාකර්ෂණ නියමය
- ග්‍රහයින්ට උපග්‍රහයන් සිටින බව හඳුනා ගැනීම

***(ලකුණු 02 යි.)***

(iv)

- ආගමික මුහුණුවරකින් වෙනස් වී ලෞකික මුහුණුවරක් ගැනීම
- නිරුවත් හා අඩනිරුවත් කලා කෘති බිහි වීම (චිත්‍ර / මූර්ති)
- කිරිගරුඬ ප්‍රතිමා නෙළීම
- කලා ශිල්පීන් හා කලා කෘති නම් කර තිබීම

***(ලකුණු 02 + 03 = 05 යි.)***

(v) **දේශපාලන**

- නව රටවල් සොයා ගැනීම
- යටත්විජිතකරණය
- ආසියා, අප්‍රිකා, අමෙරිකා මහද්වීපවල යුරෝපා බල ව්‍යාප්තිය
- යටත් විජිත අයිති කරගැනීමේ බල තරඟය

**ආර්ථික**

- යටත්විජිතවල ධන සම්පත් මව් රටවලට ගෙන යාම
- වෙළෙඳාම පුළුල් වීම
- මුදල් - නෝට්ටු, කාසි භාවිතය සුලබ වීම
- බැංකු ක්‍රම ඇති වීම
- වෙළෙඳාම නිසා ධනවත් පිරිසක් බිහි වීම
- වෙළෙඳ නගර හා වෙළෙඳ වරායවල වර්ධනය

WWW.OLEVELAPI.COM

***(ලකුණු 03 + 03 = 06 යි.)***

## 09. ඉගෙනුම් පල

- කාර්මික විප්ලවයේ ආරම්භය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි
- කාර්මික විප්ලවයේ නිපැයුම් හා ඒ සම්බන්ධ පුද්ගලයන් පිළිබඳ තොරතුරු ගෙනහැර දක්වයි
- කාර්මික විප්ලවය පේෂ කර්මාන්තය කෙරෙහි බලපෑ ආකාරය පැහැදිලි කරයි
- කාර්මික විප්ලවය ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රවලට බලපෑ ආකාරය විග්‍රහ කරයි

9. (i) කාර්මික විප්ලවයේ ආරම්භයට උපකාරී වූ අමුද්‍රව්‍ය, නිමි භාණ්ඩ හා මූල්‍ය කටයුතු සම්පාදනයේදී මූලිකත්වය දැරූ බ්‍රිතාන්‍ය නගරය කුමක් ද? (ලකුණු 01 යි)

(ii) කාර්මික විප්ලව සමයේ බහුල වශයෙන් භාවිත කළ ඛනිජ වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) කාර්මික විප්ලව සමයේ දී නිපද වූ නව නිපැයුම් කිහිපයක් පහත දැක්වේ. ඒවාට සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි වරහන් තුළින් තෝරා **අනුපිළිවෙළින්** දක්වන්න.

A - දුම්රිය එන්ජිම
B - ගුවන් විදුලි යන්ත්‍රය
C - මෝටර් රථය
D - ගුවන් යානය

(හෙන්රි ෆෝඩ්, ඩෙම්ලර්, සැමුවෙල් මෝස්, ගුග්ලි මාර්කෝනි, ජෝර්ජ් ස්ටීවන්සන්, ජේම්ස් වොට්, රයිට් සහෝදරයෝ, ලෙගී බෙයාර්ඩ්) (ලකුණු 04 යි)

(iv) කාර්මික විප්ලව සමයේ එංගලන්තයේ පේෂ කර්මාන්තයේ ශීඝ්‍ර දියුණුවට බලපෑ හේතු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(v) කාර්මික විප්ලවයේ බලපෑමේ ප්‍රතිඵල වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ සහ සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් **එක** බැගින් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 06 යි)

(i) ලන්ඩන්

***(ලකුණු 01යි.)***

(ii) ගල් අඟුරු
යපස්

***(ලකුණු 01 x 02 = 02 යි.)***

(iii)
A - ජෝර්ජ් ස්ටීවන්සන්
B - ගුග්ලි මාර්කෝනි
C - ඩෙම්ලර්
D - රයිට් සහෝදරයෝ

***(ලකුණු 01 X 04 = 04 යි.)***

(iv)

WWW.OLEVELAPI.COM

- නව යන්ත්‍ර සූත්‍ර නිපදවීම
  (දුවන නඩාව, ජෙනී යන්ත්‍රය - කපු කැටීමට, ජල රාමුව...........)
- නව තාක්ෂණික ක්‍රම සොයා ගැනීම
- බ්‍රිතාන්‍යයේ නිෂ්පාදිත කපු රෙදිවලට දේශියව හා යටත් විජිතවල ඉහල ඉල්ලුමක් තිබීම
- පේෂ කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය පහසුවෙන් ලබා ගත හැකි වීම

***(කරුණු දෙකක් විස්තර කිරීම සඳහා)***

***(ලකුණු 02 + 03 = 05 යි.)***

(V) **ප්‍රවාහන**

- මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉදි කිරීම
- පාලම් තැනවීම

- වරාය පහසුකම් වැඩි දියුණු කිරීම
- ගුවන් ප්‍රවාහනය

**සන්නිවේදන**

- තැපැල් සේවය ආරම්භ කිරීම
- ටෙලි ග්‍රාප් සේවය
- දුරකථන සේවය

***(ලකුණු 03 + 03 = 06 යි.)***

WWW.OLEVELAPI.COM